## 4.1 පරිගණකයෙන් සිදු කර ගතහැකි කාර්ය

- අප නිවස තුල ඇති බොහෝමයක් උපකර්ණ සැලකූ විට ඒවා නිපදවා ඇත්තේ එක් කාර්යයක් සිදුකර ගැනීම සදහා පමණි.

උදා;- ගුවන් විදුලි යන්ත්‍රය - විවිධ වැඩසටහන් ශ්‍රවණය සදහා

රෙදි සෝදන යන්ත්‍රය- රෙදි සේදීම සදහා

- නමුත් පරිගණකය සැලකූවිට එමගින් විවිධ කාර්යයන් සිදු කරගත හැකිය. එමනිසා පරිගණකය බහුකාර්ය යන්ත්‍රයක් ලෙස සැලකිය හැකිය.
- අපගේ අවශ්‍යතා ඉටුකර දෙන පරිගණකය තුල ඇති විවිධ වැඩසටහන් යෙදුම් මෘදුකාංග (Application Software) ලෙස හදුන්වයි.

යෙදුම් මෘදුකාංග ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

1) පොදු කාර්යය සදහා වූ යෙදුම් මෘදුකාංග
2) විශේෂ කාර්යය සදහා වූ යෙදුම් මෘදුකාංග

(1) පරිගණකයක් භාවිතයෙන් ඔබට ඉටු කර ගත හැකි කාර්යයන් 6 පහත රූපයේ හිස් කොටු තුල ලියා දක්වන්න.




(2) යෙදුම් මෘදුකාංග භාවිතා කිරීමේදී මූලිකව යොදා ගන්නා උපාංග දෙකක් නම් කරන්න.

(3) පහත දැක්වෙන කාර්ය සදහා ගැලපෙන මෘදුකාංග වර්ගය වරහන් තුලින් තෝරා ලියන්න.
(චිත්‍රක මෘදුකාංග, වදන් සැකසුම් මෘදුකාංග, සෙවුම් යන්ත්‍ර, පැතුරුම්පත් මෘදුකාංග)

- අන්තර්ජාලයෙන් තොරතුරු සෙවීම - ..................................................................
- අයවැය වාර්තා සැකසීම - ...........................................................................
- චිත්‍ර ඇදීම -........................................................................
- ආරාධනා පත්‍ර සකස් කිරීම - ....................................................................